| |
|---|
| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභා<br>චක්‍රලේඛ ලිපි අංක 01/2025 |

මගේ අංකය PPSC/ES/14/FI/02/28
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලය
සබරගමුව පළාත් සභාව
නවනගරය,රත්නපුර
2025.01. 03

ලේකම්
පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්,
සංචාරක,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2025**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.11 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/05/P2/Rec.com හා 2024.08.26 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි, සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ **දැනට සක්‍රීය සේවයේ සිටින ක්‍රීඩා නිලධාරින්ගෙන්** මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම සීමිත බඳවා ගැනීම් සිදු කිරීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/06/10/1 හා 2024.11.20 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇත.

මෙම චක්‍රලේඛ ලිපිය පහත සුදුසුකම් සපුරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ **ක්‍රීඩා නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.** මෙම චක්‍රලේඛයේ හා අයදුම්පත්‍රයේ පිටපතක් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ (www.psc.sg.gov.lk) පළ කර ඇත.

- ක්‍රීඩා පුහුණුකරු **තනතුරේ පුරප්පාඩු** සංඛ්‍යාව :- **04**
- මෙම තනතුරේ වැටුප් පරිමාණය:MN 3- 2016 වැටුප් කේත අංකය දරණ ශ්‍රේණි සඳහා
  රු. 31,040 – 10X445 – 11X660 – 10X730 – 10X750 – 57,550/-

**1.0 පළපුරුද්ද**

**1.1** සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ **ක්‍රීඩා නිලධාරි තනතුරේ** වසර **(10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්** සම්පූර්ණ කර තිබීම හා **වැටුප් වර්ධක දහයක් (10)** උපයාගෙන තිබීම.

**2.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු වෘත්තිය සුදුසුකම්**

2.1 ක්‍රීඩා පනත යටතේ අදාළ ක්‍රීඩා ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය/සංගමය විසින් හෝ ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් නිකුත් කරන ලද **පුහුණුකරුවකුගේ බලපත්‍රයක් ලබා තිබීම** හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලබන **මාස 03** කට නොඅඩු **පුහුණු පාඨමාලාවක්** හදාරා සමත් වී තිබීම.

2.2 තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන **ජාතික වෘත්තිය කුසලතා (NVQ) හය (06)** මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික **ඩිප්ලෝමාවක්** ලබා තිබීම.

2.3 සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි ඇතුළත් ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීමට අදාළව 7.2.2.1 හි (අ) හෝ (ආ) යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.